# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 28 දරන
# ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 10 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1991 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

## 1991 අංක 28 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 87/89

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1991 අංක 28 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1976 අංක 23 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) පහත දැක්වෙන කටයුතු, එනම්, ව්‍යාපාර කළමනාකාරිත්ව සංවර්ධනය ද විශේෂයෙන්—

(අ) ව්‍යාපාරික කළමනාකාරිත්ව අධ්‍යාපනය සහ අභ්‍යාසය සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ආ) කළමනාකාරිත්ව තොරතුරු සහ උපදේශක සේවා සැපයීම ; සහ

(ඇ) නිෂ්පාදිතය වැඩි දියුණු කිරීම පහසු කරලීම ද

ආයතනයේ පොදු පරමාර්ථ වන්නේ ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) කළමනාකාරිත්ව සංවර්ධන අභ්‍යාස සහ අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීම සහ මෙහෙයවීම" ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) ව්‍යාපාර කළමනාකාරිත්ව සහ අදාළ විෂයයන් සම්බන්ධයෙන් පාඨමාලා සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ආආා) ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට හා යම් කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයෙහි විශ්ව විද්‍යාල හෝ අධිකාරී සමග අනුබද්ධ වීම ;

2—ඩී 013584—5,630 (91/04)

(ආඇ) ආයතනයේ අනුමත අධ්‍යයන පාඨමාලා හැදෑරූ තැනැත්තන්ට අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පැවරීම;

(ආඈ) ව්‍යාපාර කළමනාකාරිත්ව අධ්‍යාපනය සඳහා අනුබද්ධ ආයතන ලියාපදිංචි කිරීම."; සහ

(3) ඒ වගන්තියේ (ඔ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඔ) ආයතනයේ ව්‍යාපාර කළමනාකාරිත්ව අධ්‍යාපනයට සහ සාමාන්‍ය පරිපාලනයට අදාළ රීති සෑදීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"පාලක සභාව සංස්ථාපනය කිරීම.

6. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින්මතු "සභාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) පාලක සභාවක් ආයතනයට තිබිය යුතු ය :—

(අ) නිල බලයෙන පත්වන සාමාජිකයන් අට දෙනෙක්, එනම්—

(i) 16 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ;

(ii) පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ ;

(iii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකරණ ආයතන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සභාපති ;

(iv) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාව) සභාපති ;

(v) 1990 අංක 46 දරන කාර්මික ප්‍රවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා කර්මාන්ත උපදේශක සභාවේ සභාපති ;

(vi) වාණිජ බැංකු සංගමයේ සභාපති;

(vii) 1979 අංක 2 දරන ජාතික සංවර්ධන බැංකු පනතින් පිහිටුවනු ලද ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරි ;

(viii) 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවේ සාමාන්‍යාධිකාරි ;

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ; ඔවුන් අතුරෙන් දෙදෙනෙක් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අවුරුදු දහයක අවම පළපුරුද්දක් ඇත්තා වූ ද උසස් මට්ටමේ කළමනාකරණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ටතාවක් ලබා ඇත්තා වූ තැනැත්තන් විය යුතු අතර, අනෙක් තැනැත්තා කාර්මික සම්බන්ධතා සහ වෘත්තීය සංගම් කටයුතු පිළිබඳ අවුරුදු දහයක අවම පළපුරුද්දක් සහිත ඒ ක්ෂේත්‍රයෙහි විශිෂ්ටතාවක් ලබා තිබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා නොවන, සභාවේ සාමාජිකයන් අතුරෙන් කෙනකු සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීමේ හේතුවෙන් පාලක සභාපතිට සිය ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් සාමාජිකයකු නම් කරනු ලැබිය හැකි ය.

(4) සභාපතිවරයාගේ පත් කිරීම අවසන් කිරීම ඒ සම්බන්ධයෙන් කිසිදු හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් කළ හැකි ය.

(5) අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මගින් සභාපතිවරයාට සිය ධුරයෙන් කවර විටක වුවද ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් එය පිළිගනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(6) (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිගේ ධුර කාලය, පාලක සභාවේ ඔහුගේ සාමාජිකත්ව කාලය විය යුතු ය.

(7) යම් තැනැත්තෙක්—

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු වේ නම් හෝ එසේ පත්වේ නම් ; හෝ

(ආ) ඔහු ආයතනය විසින් හෝ ඒ වෙනුවෙන් කරන ලද යම් ගිවිසුමක් යටතේ වූ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් කෙළින්ම හෝ අන් අයුරකින් අරයි නම් හෝ භුක්ති විඳී නම්; හෝ

(ඇ) සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් හෝ ඔහුගේ කටයුතු ඉටුකිරීමෙහිලා ගත යුතු [illegible] යම් ක්‍රියා හෝ [illegible] සම්බන්ධතාවක් ඔහුට ඇත්තේ නම්

සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ [illegible] කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම වෙනුවට, "(1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "(1) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම වෙනුවට, "(1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම වෙනුවට, "(1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම වෙනුවට, "(1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ" යන වචන හා ඉලක්කම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, "මණ්ඩලයේ සාමාජිකයකු විසින්" යන වචන වෙනුවට, "3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරන ලද සභාවේ සාමාජිකයකු විසින්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ "ධුරය අත්හැර යන යම් සාමාජිකයෙක්" යන වචන වෙනුවට, "3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරන ලද සිය ධුරය අත්හැර යන සභාවේ යම් සාමාජිකයෙක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි "පස් දෙනකුගෙන්" යන වචන වෙනුවට, "සිව් දෙනකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

10. 15 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලය සංස්ථාපනය කිරීම.

15අ. (1) (අ) ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීම ;
සහ

(ආ) සභාව වෙත යොමු කරන ලද වෙන යම් කරුණක් සම්බන්ධයෙන් වාර්තා කිරීම

සඳහා ආයතනයේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුත්තේ ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විය යුතු ය.

(3) ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයට අදාළ යම් කරුණක් පිළිබඳව තීරණය කිරීමට පෙරාතුව, සභාව විසින් ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලය විමසා බැලිය යුතු ය.

(4) සභාව විසින් ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපන මණ්ඩලයේ සංයුතියට, එහි සාමාජිකයන් පත්කළයුතු ආකාරයට සහ එහි සාමාජිකයන්ගේ ධුර කාලයට අදාළ රීති සාදනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

16. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි යම් බලතල කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සභාව විමසා (3) වන උපවගන්තිය යටතේ සඳහන් සුදුසුකම් සහ තෝරා ගැනීමේ පරිපාටිය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වූ සුදුසුකම් සහ තෝරාගැනීමේ පරිපාටිය නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතු ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා තමා පත්කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයා—

(අ) ස්වකීය කාර්ය ඉටු කිරීමෙහිලා ස්ථිර වශයෙන්ම අශක්‍යතාවිනට පත් වුවහොත් ; හෝ

(ආ) ආයතනයේ පරමාර්ථ සහ යහපතට ප්‍රත්‍යක්ෂ වශයෙන්ම පටහැනි වූ යම් ක්‍රියාවක් කළහොත්

නිසි පරීක්ෂණයකින් පසු සභාව විසින් කරනු ලබන නිර්දේශය මත, අමාත්‍යවරයා විසින්, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතුය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (අ) ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් (පූර්ණ හෝ අර්ධකාලීන පදනමක් මත) ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම ; ".

**13.** ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියමකරන ලද හෝ බලය දෙන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක හෝ වෙනත් ලිඛිත නීතියක හෝ යම් දැන්වීමක, ප්‍රකාශයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනගත ආයතනයේ පාලක මණ්ඩලය අගවන "පාලක මණ්ඩලය" හෝ "මණ්ඩලයට" යන වචන යෙදෙන කවර තැනක වුවද, ඒ වචන වෙනුවට, පිළිවෙලින් "පාලක සභාව" හෝ "සභාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කිරීම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.